සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

16647

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

24-11-2016

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂයය / பாடம் / Subject | නර්තනය | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

නම :- .................................................................................... විභාග අංකය :- ....................

සැලකිය යුතුයි:
- දී ඇති උපදෙස් හොඳින් කියවන්න.
- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. 11 - 20 දක්වා ප්‍රශ්න තෝරා ගත යුත්තේ ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් කොටසෙනි.
  උදා : ඔබ ඉගෙන ගනුයේ උඩරට නර්තන සම්ප්‍රදාය නම් පිළිතුරු ලිවිය යුත්තේ උඩරට කොටසට අයත් අංක 11 - 20 දක්වා ප්‍රශ්න සඳහා පමණි.

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය පහත පිළිතුරු කොටුවෙන් තෝරා ලියන්න.

(01) භාව ප්‍රකාශනයෙන් අදහස් ප්‍රකාශ කිරීම ............................................ අභිනය නමින් හැඳින්වේ.

(02) ශිල්පීය කුසලතා වර්ධනයට නිරතුරුවම ප්‍රායෝගික ............................................ ඉතා වැදගත් වේ.


(03) අවකාශ භාවිතයේ දී මෝස්තර ගොඩ නැගීම සඳහා ............................................ භාවිතා කළ හැකිය.

(04) මහනුවර දළදා පෙරහැරේ මුල් දින පහ තුල ............................................පෙරහැර පවත්වයි.

(05) ''අක්කෙ අක්කෙ අර බලන්නකෝ'' ගීතය ............................................ චලන සඳහා වඩාත් සුදුසුය.

| සම්බන්ධතා | අභ්‍යාසය | තාලානුකූල | රංග රටා | කුඹල් |
|---|---|---|---|---|
| සාත්වික | ආහාර්ය | සරඹ | ප්‍රකාශනාත්මක | රන්දෝලි |

- පහත සඳහන් උපකාරක පද ඇසුරු කර ගනිමින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.



හරහට

(06) කාවඩි වර්ගයකි

(07) පහතරට ප්‍රධාන ශාන්තිකර්මයේ පුදලබන දෙවියෙකි.

(08) දළඳා පෙරහැරේ වස් දොස් දුරු කිරීම සඳහා විෂ්ණු දේවාලයේ දී මෙය නටනු ලබයි.

පහළට

(09) දෙවන පරාක්‍රමබාහු රජු ගැන සඳහන්වන යුගය

(10) හේන් ගොවියාට දනෙන මහන්සිය, පාලුව දුරුකර ගැනීමට ගායනා කෙරෙන කවි විශේෂයකි.

## උඩරට නර්තන සම්ප්‍රදාය

(11) ''තෙයි තක තෙයි තක තෙයි තක තෙයි'' මෙය,

(1) 9 වන පා සරඹය වේ (2) 10 වන පා සරඹය වේ.

(3) 11 වන පා සරඹය වේ (4) 12 වන පා සරඹය වේ

(12) ''බෝ කොළ අන්දම් පෙනය තගායේ....'' මෙම කවියේ තුන්වන කවි පද කොටස වන්නේ,

(1) ''ලෝ තුල රන්දම් සිරිනි දිගායේ'' ය. (2) ''නා කොළ අන්දම් පෙන හකුලායේ'' ය.

(3) ''සන්දම මෙන් දහැඩින් වකලායේ'' ය. (4) ''ඒ කුල සතරක් පෙර සිට ආයේ'' ය.

(13) ශෝක භාවය මතු කෙරෙන වාදන අවස්ථාවක් ලෙස හැඳින්විය හැකි වන්නේ,

(1) අණ බෙර වාදනයයි (2) රණ බෙර වාදනයයි

(3) මඟුල් බෙර වාදනයයි (4) මළ බෙර වාදනයයි

(14) ''පානා අසිරි නොහැර - පානා දෙනෙත් කුසුම'' යන කවිය අයත් වනුයේ,

(1) බුද්ධ ප්‍රශස්ති ගණයට ය. (2) රාජ ප්‍රශස්ති ගණයට ය.

(3) දේව ප්‍රශස්ති ගණයට ය. (4) වන්නම් ගණයට ය.

(15) එස්. පණිභාරත මහතා විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍ය කිහිපයක් වනුයේ,

(1) සිකුරු තරුව හා කුරුළු බැද්දය. (2) කරදිය හා තිත්ත බතය.

(3) ග්‍රහ අපලය හා බතේ උපතය. (4) ග්‍රහ අපලය හා කුඹි කතාවය.

- ප්‍රශ්න අංක 16 සිට 18 දක්වා නිවැරදි පිළිතුර වගුව ඇසුරෙන් තෝරන්න.

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|---|
| 1 | තොරන් යාගය | දුනු මාලප්පුව | මුදුන් තාලය |
| 2 | දවුල | සොෂක බෙරය | ගැට බෙරය |
| 3 | වෙස් ඇඳුම් කට්ටලය | තෙල්මේ ඇඳුම් කට්ටලය | පබළු ඇඳුම් කට්ටලය |

(16) උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය සඳහන් වන්නේ,

(1) 2 පේළියේ A තීරුවෙහි (2) 2 පේළියේ C තීරුවෙහි

(3) 2 පේළියේ B තීරුවෙහි (4) 2 පේළියේ B හා C තීරුවලිනි

(17) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ එන නර්තන අංගයක් දක්වෙන්නේ,

(1) 1 පේළියේ B තීරුවේය (2) 1 පේළියේ A තීරුවේය

(3) 1 පේළියේ C තීරුවේය (4) 1 පේළියේ A හා C තීරුවලය

(18) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටලය සඳහන් වන්නේ,

(1) 3 පේළියේ C තීරුවෙනි (2) 3 පේළියේ B තීරුවෙනි

(3) 3 පේළියේ A තීරුවෙනි (4) 3 පේළියේ A හා B තීරුවලිනි

(19) සංගීතයේ ප්‍රධාන ප්‍රවාහකය නාදය වන අතර නර්තනයේ ප්‍රධාන ප්‍රවාහකය

(1) චලනයයි (2) රිද්මයයි

(3) රේඛාවයි (4) අංගහාරයයි

(20) රස වින්දන ශක්තිය වර්ධනය සඳහා ඇසුරු කළ යුත්තේ,

(1) නිර්මාණ කලා කෘතීන්ය (2) උසස් කලා කෘතීන්ය

(3) විදේශීය කලා කෘතීන්ය (4) රසවත් කලා කෘතීන්ය

## පහතරට නර්තන සම්ප්‍රදාය

(11) ''තෙයි තක තත් දිත් තොං නං තා - තත් දිත් තොං නං ගදිත ගුඳා'' මෙය

(1) 9 වන පා සරඹයයි (2) 10 වන පා සරඹයයි

(3) 11 වන පා සරඹයයි (4) 12 වන පා සරඹයයි

(12) ''වලා යටින් සඳ පායන්නා සේ - වැඩ ඉද උඩු මාලේ....'' මෙම කවියේ තුන්වන කවිපද කොටස වනුයේ,

(1) ''ඇතුන් අසුන් කුඩ සේසත් සමගින් - සෙනගට ඇති ආලේ'' වේ

(2) ''මිහිපිට රන්තරු දිළිසෙන්නා සේ - පිරිවර වට දැලේ'' වේ.

(3) ''නිමල දහම් අපෙ සූරිය නරනිඳු - දකිමු ද කොයි කාලේ'' වේ.

(4) ''පැවිය ගණඳුරු දුරැර දිවාකර -පිරිවර වට දැලේ'' වේ.

(13) ශෝක භාවය මතු කෙරෙන වාදන අවස්ථාවක් ලෙස හැඳින්විය හැකි වන්නේ,

(1) අණ බෙර වාදනයයි (2) රණ බෙර වාදනයයි

(3) මඟුල් බෙර වාදනයයි (4) මළ බෙර වාදනයයි

(14) ''පාතා අසිරි නොහැර - පාතා දෙනෙත් කුසුම'' යන කවිය අයත් වනුයේ,

(1) බුද්ධ ප්‍රශස්ති ගණයටය (2) රාජ ප්‍රශස්ති ගණයටය

(3) දේව ප්‍රශස්ති ගණයටය (4) වන්නම් ගණයටය

(15) K. S. ප්‍රනාන්දු ගුරුතුමා විසින් රංග රචනයෙන් දායක වූ නාට්‍ය කිහිපයකි.

(1) ගිරිදේවි, සුරඹා වල්ලිය හා සළු පාලිය

(2) හෙළ රසාංග, සාරංග හා ජස ලෙන්චිනා

(3) ජන වේගය, මළ කෝලම් හා මිණි සලඹ

(4) නල දමයන්ති, තිත්ත බත හා බෙර හඬ

• ප්‍රශ්න අංක 16 සිට 18 තෙක් නිවැරදි පිළිතුර වගුව ඇසුරෙන් තෝරන්න.

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|---|
| 1 | දුනු මාලප්පුව | තොරන් යාගය | මුදුන් තාලය |
| 2 | දවුල | ගැට බෙරය | සෝෂක බෙරය |
| 3 | තෙල්මෙ ඇඳුම් කට්ටලය | වෙස් ඇඳුම් කට්ටලය | පබළු ඇඳුම් කට්ටලය |

(16) පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය සඳහන් වන්නේ,
(1) 2 පේළියේ A තීරුවෙනි
(2) 2 පේළියේ C තීරුවෙනි
(3) 2 පේළියේ B තීරුවෙනි
(4) 2 පේළියේ B හා C තීරුවලිනි

(17) දෙවොල් මඩු ශාන්තිකර්මයේ එන නර්තන අංගයක් දක්වෙන්නේ,
(1) 1 පේළියේ B තීරුවෙනි
(2) 1 පේළියේ A තීරුවෙනි
(3) 1 පේළියේ C තීරුවෙනි
(4) 1 පේළියේ A හා C තීරුවලිනි

(18) පහතරට නර්තන සම්ප්‍රදායේ රංග වස්ත්‍රාභරණ කට්ටලයක් සඳහන් වන්නේ,
(1) 3 පේළියේ C තීරුවෙනි
(2) 3 පේළියේ B තීරුවෙනි
(3) 3 පේළියේ A තීරුවෙනි
(4) 3 පේළියේ A හා B තීරුවලිනි

(19) සංගීතයේ ප්‍රධාන ප්‍රවාහකය නාදය වන අතර නර්තනයේ ප්‍රධාන ප්‍රවාහකය
(1) චලනයයි
(2) රිද්මයයි
(3) රේඛාවයි
(4) අංගහාරයයි

(20) රස වින්දන ශක්තිය වර්ධනය සඳහා ඇසුරු කළ යුත්තේ,
(1) නිර්මාණ කලා කෘතීන්ය
(2) උසස් කලා කෘතීන්ය
(3) විදේශීය කලා කෘතීන්ය
(4) රසවත් කලා කෘතීන්ය

## සබරගමු නර්තන සම්ප්‍රදාය

(11) "තෙයියත් දොං// තෙයිතක තරිකිට ගතිගත/// ගතිත ගතා" මෙය,
(1) 9 වන මණ්ඩි පදයයි
(2) 10 වන මණ්ඩි පදයයි
(3) 11 වන මණ්ඩි පදයයි
(4) 12 වන මණ්ඩි පදයයි

(12) "අවිය රැගෙන යුදයට ආ විලසට....." මෙම කවියේ තුන්වන කවිපදය වනුයේ
(1) "අහස් කුසේ වැහි ගුවනින් එනවිට" වේ.
(2) "හයියෙන් කීවොත් වන්නම ඔබිනට" වේ.
(3) "උදහස් වී රිව් පායන විලසට" වේ.
(4) "තිබුණේ මෙලෙසට තෙයිය තනත් තහනා" වේ.

(13) ශෝක භාවය මතු කෙරෙන වාදන අවස්ථාවක් ලෙස හැඳින්විය හැකි වන්නේ,
(1) අණ බෙර වාදනයයි
(2) රණ බෙර වාදනයයි
(3) මඟුල් බෙර වාදනයයි
(4) මළ බෙර වාදනයයි

(14) "පාතා අසිරි නොහැර - පාතා දෙනෙත් කුසුම" යන කවිය අයත් වනුයේ,

(1) බුද්ධ ප්‍රශස්ති ගණයටය (2) රාජ ප්‍රශස්ති ගණයටය

(3) දේව ප්‍රශස්ති ගණයටය (4) වන්නම් ගණයටය

(15) ජී. වී. හීන් නිලමේ මහතා විසින් නොනැසී පවත්වා ගැනීම සඳහා කටයුතු කළ ශාන්තිකර්ම කිහිපයකි.

(1) දෙවොල් මඩු, සූනියම් යාගය හා බලි

(2) රටයකුම, පහන් මඩුව හා කොහොඹා කංකාරිය

(3) ගොපලු සමයම, හැන්දෑ සමයම හා කුමාර සමයම

(4) පහන් මඩුව, ගී මඩුව හා මහ සොහොන් සමයම

- ප්‍රශ්න අංක 16 සිට 18 තෙක් නිවැරදි පිළිතුර වගුව ඇසුරෙන් තෝරන්න.

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|---|
| 1 | තොරන් යාගය | මුදුන් තාලය | දූනු මාලප්පුව |
| 2 | ගැට බෙරය | සෝෂක බෙරය | දවුල |
| 3 | පබළු ඇඳුම් කට්ටලය | වෙස් ඇඳුම් කට්ටලය | තෙල්මේ ඇඳුම් කට්ටලය |

(16) සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය සඳහන් වන්නේ,

(1) 2 පේළියේ A තීරුවේය (2) 2 පේළියේ C තීරුවේය

(3) 2 පේළියේ B තීරුවේය (4) 2 පේළියේ B හා C තීරුවලය

(17) පහන්මඩු ශාන්තිකර්මයේ එන නර්තන අංගයක් දක්වෙන්නේ,

(1) 1 පේළියේ B තීරුවෙනි (2) 1 පේළියේ A තීරුවෙනි

(3) 1 පේළියේ C තීරුවෙනි (4) 1 පේළියේ A හා C තීරුවලිනි

(18) සබරගමුව නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටලය සඳහන් වන්නේ,

(1) 3 පේළියේ C තීරුවෙනි (2) 3 පේළියේ B තීරුවෙනි

(3) 3 පේළියේ A තීරුවෙනි (4) 3 පේළියේ A හා B තීරුවලිනි

(19) සංගීතයේ ප්‍රධාන ප්‍රවාහකය නාදය වන අතර නර්තනයේ ප්‍රධාන ප්‍රවාහකය

(1) චලනයයි (2) රිද්මයයි (3) රේඛාවයි (4) අංගහාරයයි

(20) රස වින්දන ශක්තිය වර්ධනය සඳහා ඇසුරු කළ යුත්තේ,

(1) නිර්මාණ කලා කෘතීන්ය (2) උසස් කලා කෘතීන්ය

(3) විදේශීය කලා කෘතීන්ය (4) රසවත් කලා කෘතීන්ය



16652

9 ශ්‍රේණිය 24-11 2016 නර්තනය

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පමණක් පිළිතුරු සපයන්න.

(01) ''ප්‍රාසංගික කලා නිර්මාණ ප්‍රදර්ශනය කරයි'' යන කණ්ඩායම් ක්‍රියාකාරකම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ පාසලේ නර්තන ප්‍රසංගය සඳහා තෝරා ගත් තේමාව ලියන්න. (ලකුණු 02)

(ii) එම ප්‍රසංගය සඳහා ඔබ යෝජනා කරන නර්තන, ගායන, වාදන අංග 04ක් විචිත්‍රත්වයෙන් යුතුව ඉදිරිපත් කිරීම සඳහා අනු පිළිවෙලින් පෙල ගස්වන්න. (ලකුණු 04)

(iii) සාර්ථක ප්‍රසංගයක් ඉදිරිපත් කිරීමෙන් ඔබ ලබාගත් අත්දැකීම් 4ක් ලියන්න. (ලකුණු 04)

(02) (i) මාත්‍රා 2 + 3 දෙතිතට අයත් බෙර පදයක්/ දවුල් පදයක් ලියන්න. (ලකුණු 02)

(ii) මාත්‍රා තුනේ තනි තිතට අයත් කවියක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(iii) මාත්‍රා 3 + 4 දෙතිතට අයත් අඩව්වක්/ ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(03) (i) කුරුණෑගල යුගයේ නර්තන කලාව පැවති බවට තොරතුරු ඇතුළත් ඓතිහාසික මූලාශ්‍ර 2ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) දඹදෙණි යුගයේ නර්තන කලාව පැවති බවට කඳවුරු සිරිතෙහි දැක්වෙන සාධකය ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

(iii) නර්තන කලාව කෙරෙහි භාරතීය ආභාෂය ලැබුණු බවට යාපහුව යුගයේ සඳහන් සාධකයක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04)

(04) පහත සඳහන් මාතෘකා 2ක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) සතර අභිනය

(ii) ග්‍රහ පන්ති කවි

(iii) පින්නල් කෝලාට්ටම්

(iv) තූර්ය වාදන අවස්ථා (ලකුණු 5 × 2 = 10)